# මුදල් සහ බැංකු කටයුතු

**මුදල් සැපයුම**

පුළුල් මුදල් සැපයුමෙහි ($M_2$) වර්ධන වේගය සැළකිය යුතු පරිදි පහත වැටීම 1986 වර්ෂයෙහි මූල්‍ය අංශයේ දක්නට ලැබුණු ප්‍රධාන ලක්ෂණයයි. මෙයට බැංකු විදේශීය වත්කම් (ශුද්ධ) අඩු වීමක් මෙන්ම දේශීය ණය අඩු මට්ටමකින් ප්‍රසාරණය වීමද බලපෑවේය. මහජනයා සතු ව්‍යවහාර මුදල් සහ ඉල්ලුම් තැන්පතුවලින් සමන්විත වූ පටු මුදල් සැපයුම ($M_1$) 1986 දී රුපියල් දශ ලක්ෂ 2,418 කින් හෙවත් සියයට 13 කින් වැඩි වූ අතර, 1985 දී එය රුපියල් දශ ලක්ෂ 1,937 කින් හෙවත් සියයට 12 කින් වර්ධනය විය. මේ අතර, වාණිජ බැංකු වෙතැති පෞද්ගලික අංශය සතු කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතු (ආසන්න මුදල්) රුපියල් දශ ලක්ෂ 33 කින් සුළු වශයෙන් වැඩි වුණි. මේ අනුව, 1986 දී $M_1$ හා ආසන්න මුදල්වලින් සමන්විත වූ පුළුල් මුදල් සැපයුම ($M_2$) රුපියල් දශ ලක්ෂ 2,451 කින් හෙවත් සියයට 5 කින් වැඩි වූ අතර, එය 1985 දී $M_2$ හි ඇති වූ රුපියල් දශ ලක්ෂ 4,982 ක හෙවත් සියයට 11 ක වර්ධනයෙන් අඩකටත් වඩා අඩු විය.


වර්ෂය තුළ $M_1$ හි වැඩි වීමට ප්‍රධාන වශයෙන්ම මහජනයා සතු ව්‍යවහාර මුදල් රුපියල් දශ ලක්ෂ 1,754 කින් හෙවත් සියයට 18 කින් වර්ධනය වීම හේතු විය. 1985 දී මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් රුපියල් දශ ලක්ෂ 1,255 කින් හෙවත් සියයට 15 කින් වැඩි වුණි. 1985 දී දක්නට ලැබුන උපනතිය අනුගමනය කරමින් ව්‍යවහාර මුදල් දැරීම් පිළිබඳව මාසිකව සිදු වූ ඉහළම වර්ධනය (සියයට 9 ක) වාර්තා වූයේ මාර්තු මාසයේදී වූ අතර, අප්‍රේල් මස උත්සව කාලයට පෙර මුදල් සඳහා පැවති ඉල්ලුමේ ඉහළ යෑම ඉන් පිළිබිඹු විය. මේ අතර, 1986 දී මහජනයා විසින් දරූ ඉල්ලුම් තැන්පතු රුපියල් දශ ලක්ෂ 664 කින් හෙවත් සියයට 7 කින් වැඩි විය. මෙම තැන්පතු 1985 දී රුපියල් දශ ලක්ෂ 683 කින් හෙවත් සියයට 8 කින් වර්ධනය වී තිබුණි. මේ අනුව, 1985 අවසානයේ සියයට 48 ක්ව පැවති $M_1$ හි ඉල්ලුම් තැන්පතු කොටස 1986 අවසානයේදී සියයට 45 ක් දක්වා තවදුරටත් අඩු විය. මුදල් සැපයුමෙහි ව්‍යවහාර මුදල් කොටසෙහි සාපේක්ෂ වශයෙන් ඇති වූ ඉහළ වර්ධනය, 1984 සිටම දක්නට ලැබුන ලක්ෂණයකි. උතුරු සහ නැගෙනහිර පළාත්වල සමහර ප්‍රදේශයන්හි පූර්ණ බැංකු සේවා ලබා ගැනීමට මහජනයාට නොහැකිවීමෙන් මෙම ලක්ෂණය තරමක් දුරට පැහැදිලි කෙරේ.

විමසුමට භාජනය වන වර්ෂය තුළදී, ආසන්න මුදල් රුපියල් දශ ලක්ෂ 33 කින් වැඩි වූ අතර, 1985 දී එය රුපියල් දශ ලක්ෂ 3,044 ක හෙවත් සියයට 11 ක සැළකිය යුතු වර්ධනයක් පෙන්වීය. 1986 දී ආසන්න මුදල් වර්ධනයේ පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතුවූයේ රාජ්‍ය සංස්ථා සතු කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතු රුපියල් දශ ලක්ෂ 1,067 කින් හෙවත් සියයට 18 කින් අඩු වීමය. මෙම තැන්පතුවල සැළකිය යුතු අඩුවීම් වාර්තා කළ ආයතනයන් දෙකක් වූයේ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව හා ලංකා විදුලිබල මණ්ඩලයයි. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ තැන්පතු අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ තේ මිළ පහත වැටීමයි. ලංකා විදුලිබල මණ්ඩලයෙහි තැන්පතු තියුණු ලෙස අඩු වීමට රජයේ භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළෙහි ආයෝජනය කිරීම සඳහා තැන්පතු මුදල් ආපසු ලබා ගැනීම හේතු විය.

මේ අතර, අනෙකුත් පෞද්ගලික අංශයෙහි (රාජ්‍ය සංස්ථා හා සමුපකාර ආයතන හැර) ගණුදෙනු කරුවන් සතු කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතු රුපියල් දශ ලක්ෂ 1,032 ක හෙවත් සියයට 4 ක අඩු වර්ධනයක් වාර්තා කළේය. කලින් වර්ෂයේ එම තැන්පතුවල රුපියල් දශ ලක්ෂ 2,637 ක හෙවත් සියයට 13 ක වඩා තියුණු වර්ධනයක් ඇතිවුණි. අනෙකුත් පෞද්ගලික අංශයෙහි ආසන්න මුදල් වර්ධනය අඩු වීමට බලපෑ හේතු අතර අපනයන අංශයන්හි අඩු ක්‍රියාකාරිත්වය සහ උතුරු සහ නැගෙනහිර පළාත්වල ඇතැම් ප්‍රදේශයන්හි බැංකු සේවා පහසුකම් පූර්ණ වශයෙන් නොපැවැත්වීමද විය. කෙසේ වෙතත්, 1986 දී සමුපකාර ආයතන සතු කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතු රුපියල් දශ ලක්ෂ 69 කින් හෙවත් සියයට 11 කින් වර්ධනය විය.

# මුදල් සැපයුම

මාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

## 1 . 44 සංඛ්‍යා සටහන

## මූල්‍ය සමස්තයන් 1984 – 1986

රුපියල් දශ ලක්ෂ

| | පටු මුදල් සැපයුම (M1) | | | | | | පුළුල් මුදල් සැපයුම (M2) | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1984 | 1985 | 1986 | වෙනස % 1983/1984 | වෙනස % 1984/1985 | වෙනස % 1985/1986 | 1984 | 1985 | 1986 | වෙනස % 1983/1984 | වෙනස % 1984/1985 | වෙනස % 1985/1986 |
| ජනවාරි .. | 14,964 | 16,522 | 18,456 | + 26·3 | + 10·4 | + 11·7 | 38,277 | 43,923 | 48,498 | + 24·3 | + 14·8 | + 10·4 |
| පෙබරවාරි .. | 14,939 | 16,595 | 19,062 | + 22·1 | + 11·1 | + 14·9 | 39,031 | 44,849 | 48,587 | + 23·1 | + 14·9 | + 8·3 |
| මාර්තු .. | 15,439 | 17,237 | 20,454 | + 18·9 | + 11·7 | + 18·7 | 39,762 | 45,230 | 49,410 | + 21·0 | + 13·8 | + 9·2 |
| අප්‍රේල් .. | 15,317 | 17,332 | 20,287 | + 19·3 | + 13·2 | + 17·1 | 39,629 | 46,019 | 49,335 | + 19·7 | + 16·1 | + 7·2 |
| මැයි .. | 14,331 | 17,208 | 20,043 | + 13·7 | + 20·1 | + 16·5 | 39,133 | 46,092 | 49,119 | + 20·4 | + 17·8 | + 6·6 |
| ජූනි .. | 14,768 | 17,339 | 19,949 | + 17·3 | + 17·4 | + 15·1 | 39,690 | 46,233 | 48,959 | + 21·0 | + 16·5 | + 5·9 |
| ජූලි .. | 14,901 | 16,969 | 19,615 | + 14·9 | + 13·9 | + 15·6 | 39,642 | 46,631 | 48,882 | + 17·1 | + 17·6 | + 4·8 |
| අගෝස්තු .. | 14,811 | 17,232 | 19,731 | + 14·1 | + 16·4 | + 14·5 | 39,767 | 46,991 | 48,771 | + 17·9 | + 18·2 | + 3·8 |
| සැප්තැම්බර් .. | 15,549 | 17,460 | 20,399 | + 16·7 | + 12·3 | + 16·8 | 40,808 | 47,917 | 49,430 | + 17·9 | + 17·4 | + 3·2 |
| ඔක්තෝබර් .. | 16,041 | 17,768 | 20,219 | + 18·2 | + 10·8 | + 13·8 | 41,586 | 48,359 | 49,868 | + 17·8 | + 16·3 | + 3·1 |
| නොවැම්බර් .. | 15,678 | 18,187 | 20,293 | + 15·8 | + 16·0 | + 11·6 | 42,007 | 47,247 | 50,057 | + 18·9 | + 12·5 | + 6·0 |
| දෙසැම්බර් .. | 16,824 | 18,761 | 21,179 | + 14·1 | + 11·5 | + 12·9 | 43,427 | 48,409 | 50,860 | + 16·6 | + 11·4 | + 5·1 |
| මාසික සාමාන්‍යය .. | 15,297 | 17,384 | 19,974 | + 17·5 | + 13·7 | + 14·9 | 40,230 | 46,492 | 49,315 | + 19·5 | + 15·6 | + 6·1 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

1986 දී විදේශීය අංශය නොකඩවා දෙවන වසරටත් මුල්‍ය සමස්තයන් කෙරෙහි සංකෝචනාත්මක බලපෑමක් ඇති කළේය. බැංකු විදේශීය වත්කම් (ශුද්ධ) රුපියල් දශ ලක්ෂ 414 කින් හෙවත් සියයට 4 කින් 1986 වර්ෂයේදී පහත වැටුන අතර, 1985 වර්ෂයේදී එම වත්කම් රුපියල් දශ ලක්ෂ 691 කින් හෙවත් සියයට 7 කින් අඩු වුණි. මහ බැංකුවෙහි ශුද්ධ විදේශ වත්කම් රුපියල් දශ ලක්ෂ 238 කින්ද, වාණිජ බැංකු සතු විදේශ විනිමය දැරීම් (ශුද්ධ) රුපියල් දශ ලක්ෂ 175 කින්ද පහත වැටීම වර්ෂය තුළ බැංකු විදේශීය වත්කම් (ශුද්ධ) අඩු වීමට හේතු විය.


ප්‍රධාන වශයෙන්ම, ඉන්ධන මිළ පහත වැටීමෙහි හිතකර බලපෑම නිසා, ගෙවුම් තුලනයේ වෙළෙඳ ගිණුමෙහි හා ජංගම ගිණුමෙහි අඩු හිඟයන් වාර්තා වුවත්, මුළු හිඟයම පියවීම සඳහා සෑහෙන තරම් සම්පත් රාශීකරණය කර ගැනීමට රටට නොහැකි විය. වර්ෂය තුළදී පෞද්ගලික සංක්‍රාම මෙන්ම නිල සංක්‍රාම (ශුද්ධ) ලැබීම්ද පහත වැටුණි. මේ අනුව, 1986 දී රුපියල් දශ ලක්ෂ 2,124 ක සමස්ත හිඟයක් ගෙවුම් තුලනයෙහි වාර්තා වූ අතර, ගෙවුම් ශේෂ තත්ත්වයෙහි නොකඩවා පවතින දුර්වලතාව එමගින් ඉස්මතු කර දැක්වුණි.

බැංකු විදේශ වත්කම් (ශුද්ධ) වර්ෂය තුළදී අඩුවීම හේතුවෙන්, 1986 වර්ෂයේදී මුදල් සැපයුමේ වර්ධනය සඳහා දායක වූ වඩාත්ම වැදගත් සාධකය වූයේ දේශීය ණය රුපියල් දශ ලක්ෂ 4,883 කින් හෙවත් සියයට 8 කින් වැඩි වීමය. මේ හා සැසඳීමේදී රුපියල් දශ ලක්ෂ 9,300 ක හෙවත් සියයට 19 ක වඩාත් විශාල ප්‍රමාණයක දේශීය ණය වර්ධනයක් 1985 දී දක්නට ලැබිණි. රජයට දෙන ලද ශුද්ධ ණය හා පෞද්ගලික අංශයට සැපයූ දළ ණය අඩුවෙන් වර්ධනය වීම දේශීය ණය ප්‍රසාරණ වේගය අඩු වීමට බලපෑවේය. 1986 දී රජයට දෙන ලද ශුද්ධ ණය රුපියල් දශ ලක්ෂ 2,198 කින් හෙවත් සියයට 11 කින් වැඩි වුණි. 1985 දී එහි රුපියල් දශ ලක්ෂ 5,793 ක හෙවත් සියයට 40 ක වඩා තියුණු වර්ධනයක් දක්නට ලැබුණි. කෙසේ වෙතත්, රජයට දුන් ශුද්ධ ණයෙහි අඩු වර්ධනයක් පැවතියද, එකී ණය මුළු දේශීය ණයෙහි ප්‍රතිශතයක් වශයෙන් 1984 දී සියයට 29 ක් වූ අතර, 1985 දී එය සියයට 34 ක් දක්වාත්, 1986 දී තවදුරටත් සියයට 35 ක් දක්වාත් ඉහළ නැඟුණි. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, වර්ෂය තුළ පෞද්ගලික අංශයට දුන් ණය සාපේක්ෂ වශයෙන් අඩු වර්ධනයක් පිළිබිඹු කිරීමයි. 1986 දී රජයට දුන් ශුද්ධ ණය ඉහළ නැගීම, රජයට දෙන ලද (දළ) ණය රුපියල් දශ ලක්ෂ 1,941 කින් හෙවත් සියයට 8 කින් සහ රජය සතු තැන්පතු හා මුදල් ශේෂ රුපියල් දශ ලක්ෂ 257 කින් හෙවත් සියයට 5 කින් පහත වැටීමෙන් ඇතිවූ ඒකාබද්ධ ප්‍රතිඵලය විය. 1986 දී මහ බැංකුව විසින් රජයට දෙන ලද ණය රුපියල් දශ ලක්ෂ 2,085 කින් හෙවත් සියයට 9 කින් වැඩි වූ අතර, ඒ හා සැසඳීමේදී ඉකුත් වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 7,511 ක හෙවත් සියයට 49 ක වඩා තියුණු වර්ධනයක් පිළිබිඹු කළේය. රජය, මහ බැංකුව වෙතින් ලබාගත් ණය සමන්විත වූයේ තාවකාලික අත්තිකාරම් රුපියල් දශ ලක්ෂ 406 ක වැඩි වීමකින් හා රජයේ හා රජය සහතික කළ සුරැකුම්පත් රුපියල් දශ ලක්ෂ 1,679 කින්ද වැඩි වීමෙනි. මේ අතර, වාණිජ බැංකු විසින් රජයට සැපයූ ණය රුපියල් දශ ලක්ෂ 144 කින් හෙවත් සියයට 5 කින් මෙම වර්ෂය තුළදී අඩු විය. බැංකු ක්‍රමය වෙතින් ණය ගැනීම් අඩු කිරීමට රජයට හැකි වූයේ, 1985 අගදී රුපියල් දශ ලක්ෂ 1,659 ක් වූ බැංකු නොවන පෞද්ගලික අංශයෙහි භාණ්ඩාගාර බිල්පත් දැරීම් 1986 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 3,909 දක්වා සැළකිය යුතු ලෙස වැඩිවීම හේතුකොටගෙනය. මෙයට අමතරව, 1986 පෙබරවාරි මාසයේදී මහ බැංකුවේ ලාභවලින් රුපියල් දශ ලක්ෂ 1,779 ක් රජය වෙත පැවරීම හේතුකොටගෙන බැංකු ක්‍රමය වෙතින් රජයේ ණය ගැනීමේ අවශ්‍යතාවය අඩු කෙරුණි.

වර්ෂය තුළ දී, රාජ්‍ය සංස්ථා, සමුපකාර ආයතන හා අනෙකුත් පෞද්ගලික අංශයෙහි ගණුදෙනු කරුවන්ගෙන් සමන්විත වූ පෞද්ගලික අංශයට වාණිජ බැංකු මගින් සැපයූ දළ ණය රුපියල් දශ ලක්ෂ 2,684 කින් හෙවත් සියයට 7 කින් වැඩි විය. 1985 වර්ෂයේදී මෙම අංශයට දුන් ණය රුපියල් දශ ලක්ෂ 3,507 කින් හෙවත් සියයට 10 කින් ඉහළ නැඟුණි. පෞද්ගලික අංශයට දුන් දළ ණයෙහි වැඩි වීමෙන් ප්‍රධාන කොටසකට (සියයට 84) හිමිකම් පෑවේ පෞද්ගලික

# දේශීය ණය

මාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

## 1 . 45 සංඛ්‍යා සටහන

## මූල්‍ය සමස්තයන් සහ ඒවාට තුඩු දුන් සාධක

ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | 1984 දෙසැම්බර් | 1985 දෙසැම්බර් | 1986 දෙසැම්බර් | 1984/1985 වෙනස | | 1985/1986 වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | | | | ප්‍රමාණය | සියයට ගණන | ප්‍රමාණය | සියයට ගණන |
| **මූල්‍ය සමස්තයන්** | | | | | | | |
| 1. මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් .. | 8,560·9 | 9,815·5 | 11,570·0 | + 1,254·6 | +14·7 | +1,754·4 | + 17·9 |
| 2. මහජනයා වෙතැති ඉල්ලුම් තැන්පතු .. | 8,262·9 | 8,945·5 | 9,609·3 | + 682·6 | + 8·3 | + 663·8 | + 7·4 |
| පටු මුදල් සැපයුම (M1) .. | 16,823·8 | 18,761·0 | 21,179·3 | + 1,937·2 | +11·6 | +2,418·2 | + 12·9 |
| 3. වාණිජ බැංකු වෙතැති පෞද්ගලික අංශයේ කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතු .. | 26,603·5 | 29,647·9 | 29,681·0 | + 3,044·4 | +11·4 | + 33·2 | + 0·1 |
| 3·1 සමුපකාර ආයතන .. | 526·8 | 633·5 | 702·2 | + 106·7 | +20·3 | + 68·7 | + 10·8 |
| 3·2 රාජ්‍ය සංස්ථා .. | 5,508·8 | 5 809·5 | 4,742·1 | + 300·7 | + 5·5 | -1,067·3 | - 18·4 |
| 3·3 අනෙකුත් පෞද්ගලික අංශයේ ගණුදෙනුකරුවන්(අ) .. | 20,567·9 | 23,204·9 | 24,236·7 | + 2,637·0 | +12·8 | +1,031·8 | + 4·4 |
| පුළුල් මුදල් සැපයුම (M2) .. | 43,427·3 | 48,408·9 | 50,860·3 | + 4,981·6 | +11·4 | +2,451·4 | + 5·1 |
| **තුඩුදුන් සාධක** | | | | | | | |
| 1. දේශීය ණය .. | 49,926·2 | 59,226·1 | 64,108·8 | + 9,299·9 | +18·6 | +4,882·7 | + 8·2 |
| 1·1 රජයට දෙන ලද ශුද්ධ ණය .. | 14,554·4 | 20,347·6 | 22,546·1 | + 5,793·2 | +39·8 | +2,198·5 | + 10·8 |
| 1·1·1 රජයට දෙන ලද දළ ණය .. | 18,164·6 | 25,657·9 | 27,599·4 | + 7,493·3 | +41·3 | +1,941·5 | + 7·6 |
| මහ බැංකුව විසින් .. | 15,249·1 | 22,760·6 | 24,846·0 | + 7,511·5 | +49·3 | +2,085·5 | + 9·2 |
| වාණිජ බැංකු විසින් .. | 2,915·5 | 2,897·3 | 2,753·4 | - 18·1 | - 0·6 | - 144·0 | - 5·0 |
| 1·1·2 රජයේ තැන්පතු සහ මුදල් ශේෂ .. | 3,610·2 | 5,310·3 | 5,053·3 | - 1,700·1 | -47·1 | + 257·0 | + 4·8 |
| 1·2 පෞද්ගලික අංශයට දෙන ලද දළ ණය .. | 35,371·8 | 38,878·5 | 41,562·7 | + 3,506·7 | + 9·9 | +2,684·2 | + 6·9 |
| 1·2·1 සමුපකාර ආයතන .. | 1,567·6 | 1,304·3 | 1,424·5 | - 263·3 | -16·8 | + 120·2 | + 9·2 |
| 1·2·2 රාජ්‍ය සංස්ථා .. | 4,148·2 | 4,437·9 | 4,738·5 | + 289·7 | + 7·0 | + 300·6 | + 6·8 |
| 1·2·3 අනෙකුත් පෞද්ගලික අංශයේ ගණුදෙනු කරුවන් .. | 29,656·0 | 33,136·3 | 35,399·7 | + 3,480·3 | +11·7 | +2,263·4 | + 6·8 |
| 2. බැංකු විදේශීය වත්කම් (ශුද්ධ) .. | 9,964·1 | 9,272·7 | 8,859·1 | - 691·4 | - 6·9 | - 413·6 | - 4·5 |
| 3. අනෙකුත් ශීර්ෂ (ශුද්ධ) .. | -16,463·0 | -20,089·9 | -22,107·6 | - 3,626·9 | | -2,017·7 | |
| 3·1 මහ බැංකුවේ අනෙකුත් වගකීම් (ශුද්ධ) .. | -9,982·6 | -13,197·2 | -15,332·4 | - 3,214·5 | | -2,135·2 | |
| 3·2 වාණිජ බැංකුවල අනෙකුත් වගකීම් (ශුද්ධ) .. | -6,506·3 | -7,186·9 | -6,880·9 | - 680·7 | | + 306·0 | |
| 3·3 භූවමාරුවෙමින් පවත්නා ශීර්ෂයන් සඳහා ගැලපිලි . | 25·9 | 294·2 | 105·7 | + 268·3 | | - 188·6 | |
| පුළුල් මුදල් සැපයුම (M2) . | 43,427·3 | 48,408·9 | 50,860·3 | + 4,981·6 | +11·4 | +2,451·4 | + 5·1 |


සටහන: සලකුණු වලින් පුළුල් මුදල් සැපයුම (M2) කෙරෙහි ඇති වූ බලපෑම දක්වේ.

(අ) නිර්නේවාසිකයන්ගේ විදේශීය ව්‍යවහාර මුදල් තැන්පතු ඇතුළත් නොවේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

# බැංකු විදේශීය වත්කම් (ශුද්ධ)

මාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

අංශයේ අනෙකුත් ගණුදෙනු කරුවන් විසිනි. කෙසේ වෙතත්, මෙම අංශයට දුන් දළ ණය 1986 දී වැඩිවූයේ රුපියල් දශ ලක්ෂ 2,263 කින් හෙවත් සියයට 7 කින් පමණකි. සංසන්දනාත්මකව බැලීමේදී 1985 වර්ෂයෙහි දී මෙම අංශයට දෙන ලද ණයෙහි රුපියල් දශ ලක්ෂ 3,480 ක හෙවත් සියයට 12 ක වර්ධනයක් විය. 1986 දී අනෙකුත් පෞද්ගලික අංශයට දෙන ලද ණයෙහි වර්ධනය ප්‍රධාන වශයෙන් ණය මුදල් (රුපියල් දශ ලක්ෂ 1,629) සහ අයිරා (රුපියල් දශ ලක්ෂ 680) වලින් සමන්විත විය. මේ අතර, 1986 දී ආනයන බිල්පත් දූරිම් රුපියල් දශ ලක්ෂ 82 කින් පහත් වැටුණි.

සමුපකාර ආයතනවලට දෙන ලද ණය, 1986 දී රුපියල් දශ ලක්ෂ 120 කින් හෙවත් සියයට 9 කින් ඉහළ නැගුණි. 1985 දී මෙම ආයතනවලට දෙන ලද ණයෙහි රුපියල් දශ ලක්ෂ 263 ක හෙවත් සියයට 17 ක පහත වැටීමක් පෙන්නුම් කෙරුණි. සහතික මිළ ක්‍රමය යටතේ වී මිළදී ගැනීම සඳහා දෙන ලද අත්තිකාරම්හි වර්ධනය ප්‍රධාන වශයෙන් පිළිබිඹු කරමින්, වර්ෂයේ ප්‍රථම මාස පහ තුළදී, සමුපකාර ආයතනවලට දෙන ලද ණය රුපියල් දශ ලක්ෂ 285 කින් හෙවත් සියයට 22 කින් වැඩි විය.

1986 දී රාජ්‍ය සංස්ථාවලට දුන් වාණිජ බැංකු ණය, රුපියල් දශ ලක්ෂ 301 කින් හෙවත් සියයට 7 කින් වැඩිවූ අතර, 1985 දීද දෙන ලද එකී ණය මෙවැනිම ප්‍රමාණයකින් එනම්, රුපියල් දශ ලක්ෂ 290 කින් හෙවත් සියයට 7 කින් වැඩිවිය. තේ මිළ පහත වැටීම හේතුවෙන් ස්වකීය ඉපැයීම් පහත වැටුනෙන්, රජයේ වැවිලි සංස්ථා දෙකෙහි ණය ලබා ගැනීම් මෙම වර්ෂය තුළ දී සැළකිය යුතුසේ වර්ධනය විය. මේ අතර, 1986 දී ජාතික පේෂකර්ම සංස්ථාව, සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව, ලංකා සිමෙන්ති සංස්ථාව හා නාගරික සංවර්ධන අධිකාරියද වාණිජ බැංකු වෙතින් ණය ලබා ගැනීම, සැළකිය යුතුසේ අඩු කිරීමට සමත් වූහ.

**වාණිජ බැංකු කටයුතු**

නොකඩවා දෙවෙනි වසරටත් බැංකු විදේශීය වත්කම්හි (ශුද්ධ) සැළකිය යුතු අඩුවීම ද සමහර ආයතන විසින් වෙනත් ආයෝජන මාර්ගවල ආයෝජනය කිරීම සඳහා වාණිජ බැංකුවල පැවති ඒවායේ අරමුදල් ආපසු ලබා ගැනීමද මධ්‍යයේ 1986 දී වාණිජ බැංකු තවදුරටත් අධි ද්‍රවශීලතා තත්ත්වයක පැවතියේය. මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ රජයේ වියදම් ඉහළ මට්ටමක තවදුරටත් පැවතීම සහ පෞද්ගලික අංශයේ ණය සඳහා වූ අඩු ඉල්ලුමත්ය.

අන්තර් බැංකු අරමුදල් සඳහා දුර්වල ඉල්ලුමක් පැවතීම පිළිබිඹු කරමින් අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳපොලෙහි ක්‍රියාකාරිත්වයෙහි 1986 වසර තුළදී දක්නට ලැබුනේ මධ්‍යස්ථ වර්ධනයකි. මෙම වෙළෙඳපොලෙහි නොපියවා පැවති ණය ශේෂයන් 1985 වර්ෂය අවසානයේදී රුපියල් දශ ලක්ෂ 287 සිට 1986 වර්ෂය අවසානයේදී රුපියල් දශ ලක්ෂ 316 දක්වා වැඩිවුණි. ඒ අතර, ණය සඳහා වූ පොළී අනුපාතිකයන් වර්ෂයකට සියයට 9.5 සිට සියයට 14 අතර පරතරයක උච්චාවචනය විය. 1985 වසරේ මෙම පොළී අනුපාතික පරතරය වර්ෂයකට සියයට 11 සිට සියයට 15 ක් අතර පැවතුණි. අන්තර් බැංකු අරමුදල් සඳහා පැවති අඩු ඉල්ලුම ස්වකීය අතිරික්ත අරමුදල් අනෙකුත් කෙටි කාලීන ආයෝජන මාර්ගයන්හි යෙදවීමට වාණිජ බැංකු පෙළඹවිය. මෙයින් සැළකිය යුතු ප්‍රමාණයක් ද්විතීයික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොලේ ආයෝජනය කෙරුණි. ද්විතීයික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොලේ නොපියවා පැවති ශුද්ධ විකුණුම් ප්‍රමාණය වසර තුළ රුපියල් දශ ලක්ෂ 1,168 සහ රුපියල් දශ ලක්ෂ 2,622 අතර උච්චාවචනය විය. ඒ අතරම, වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත්හි සිදුකරන ලද ආයෝජනයන් 1985 වසර අවසානයේදී වූ රුපියල් දශ ලක්ෂ 890 සිට 1986 වසර අවසානයේදී රුපියල් දශ ලක්ෂ 1,905 දක්වා වැඩි විය.

1986 අගෝස්තු මාසයේදී ශ්‍රී ලංකා මහ බැංකුව, වාණිජ බැංකු විසින් නිකුත් කරන ලද් නොපියවා පැවති තැන්පතු සහතිකපත් ප්‍රමාණය සඳහා පනවා තිබූ සීමාව ඉවත් කරන ලදී. බැංකු විසින් නිකුත් කරන ලද නොපියවා පැවති සහතිකපත් ප්‍රමාණය 1986 දී රුපියල් දශ ලක්ෂ 605 කින් වැඩි වී වර්ෂය අවසානයේදී රුපියල් දශ ලක්ෂ 1,673 ක් විය.

1986 වසර තුළදී වාණිජ බැංකු ස්වකීය ගණුදෙනු කරුවන් හට සළසන සේවාවන් කාර්යක්ෂම කිරීම සඳහා තවදුරටත් පියවරයන් ගනු ලැබීය. මෙම පියවරයන් අතර, ගණුදෙනු කිරීමේ වේලාවන් දීර්ඝ කිරීම, බැංකු කටයුතු පරිගණක යන්ත්‍ර මගින් සිදු කිරීම සහ බැංකු සේවාවේ නියැලි මිනිස් බල සම්පත් සංවර්ධනය හා පුහුණු කිරීමේ කටයුතු වඩාත් සූක්ෂම කිරීමත් වේ. මේ අතර, ගණුදෙනු කරුවන්ගේ ප්‍රයෝජනය සඳහා එක් බැංකුවක් විසින් 'ස්වයංක්‍රීය ටෙලර්' මැෂින් ක්‍රමය හඳුන්වා දෙනු ලැබීය.

වර්ෂය තුළදී ශ්‍රී ලංකාවේ විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක 24 ක් ක්‍රියාත්මක වෙමින් පැවතුණි. 1986 වර්ෂයේදී විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්හි මුළු වත්කම්/වගකීම් රුපියල් දශ ලක්ෂ 460 කින් සුළු වශයෙන් අඩු වූ අතර, වසර අවසානයට එය රුපියල් දශ ලක්ෂ 19,619 ක් විය. විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන් සාමූහික ණය කටයුතුවලට සහභාගී වීම, අනුමැතිය ලත් නේවාසිකයන්ට අත්තිකාරම් සැපයීම සහ මහ කොළඹ ආර්ථික කොමිසම යටතේ ඇති ව්‍යාපෘතිවලට මූල්‍ය පහසුකම් ලබා දීමේ කටයුතුවල නිරත වුණි.

1986 වසර තුළදී වාණිජ බැංකු සතු මුළු සම්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 3,937 කින් වැඩි වුණි. 1985 වසරේදී එහි රුපියල් දශ ලක්ෂ 5,830 ක් වූ විශාල වැඩිවීමක් දක්නට ලැබුණි. 1986 වසරේ සම්පත්වල අඩු වර්ධනයට බොහෝදුරට හේතු වූයේ පසුගිය වසරට වඩා තැන්පතුවල දක්නට ලැබුණ අඩු වර්ධනයයි. 1985 වසරේ වූ රුපියල් දශ ලක්ෂ 5,528 ක් වූ තියුණු වැඩි වීම සමග සසඳන විට, 1986 වසරේ මුළු තැන්පතු වගකීම් රුපියල් දශ ලක්ෂ 1,843 කින් වැඩි වුණි. 1986 වසරේ තැන්පතුවල දක්නට ලැබුණ මෙම වර්ධනය කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතු (රාජ්‍ය බැංකු දෙකේ දිගුකාලීන තැන්පතුද ඇතුළුව) හා ඉල්ලුම් තැන්පතු පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 1,073 කින් හා රුපියල් දශ ලක්ෂ 770 කින් සමන්විත විය. වර්ෂය තුළදී වාණිජ බැංකුවල ණය ගැනීම් රුපියල් දශ ලක්ෂ 1,587 කින් වැඩි විය. මෙය, අන්තර් බැංකු ණය ගැනීම් (මහ බැංකුවද ඇතුළුව) සහ විදේශීය ණය ගැනීම් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 1,107 කින් හා රුපියල් දශ ලක්ෂ 480 කින් සමන්විත විය. වර්ෂය තුළදී වාණිජ බැංකු, මහ බැංකුවෙන් ලබාගත් ණය රුපියල් දශ ලක්ෂ 975 කින් වැඩි වූ අතර, එය විවිධ ප්‍රතිමූල්‍ය පහසුකම් යටතේ ලබා දුන් ණය පහසුකම්වල වර්ධනයක ප්‍රතිඵලයක් විය. ඒ අතර, 1986 දී වාණිජ බැංකුවල අනෙකුත් වගකීම් රුපියල් දශ ලක්ෂ 261 කින් වැඩි වූ අතර, එමගින් ඒවායේ සම්පත් පදනමද පුළුල් කෙරුණි.

වාණිජ බැංකු සම්පත්වල වෙනස්කම් සහ ඒවායේ උපයෝගීකරණය ශුද්ධ පදනමක් මත 1.46 සංඛ්‍යා සටහනෙහි දක්වේ. 1986 වර්ෂය තුළ රාජ්‍ය සංස්ථා වාණිජ බැංකු සතු සම්පත්වලින් රුපියල් දශ ලක්ෂ 1,670 ක ප්‍රමාණයක් භාවිතා කරන්නට යෙදුණි. මේ අනුව, වාණිජ බැංකු සම්පත් වැඩි වශයෙන්ම භාවිතා කළ අංශය බවට රාජ්‍ය සංස්ථා කැපී පෙනෙන්නට විය. මෙය, තැන්පතු අඩුවීමක (රුපියල් දශ ලක්ෂ 1,369) සහ ණය ගැනීම් වැඩි වීමක( රුපියල් දශ ලක්ෂ 301) ඒකාබද්ධ ප්‍රතිඵලයක් විය. මේ අතර, වාණිජ බැංකු සතු සම්පත් වලින් රුපියල් දශ ලක්ෂ 163 ක් පෞද්ගලික අංශයේ අනෙකුත් ගණුදෙනුකරුවන් විසින් ප්‍රයෝජනයට ගන්නා ලදී.

1986 දී අන්තර් බැංකු අංශයෙන් වාණිජ බැංකුවලට ශුද්ධ වශයෙන් එක්වූ සම්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 705 ක් විය. මේ අතර, මහ බැංකුව වාණිජ බැංකු වල ශුද්ධ සම්පත් ප්‍රමාණය වර්ධනය කිරීම පිණිස රුපියල් දශ ලක්ෂ 634 කින් දායකවිය. මෙය සමන්විත වූයේ මහ බැංකුවෙන් ලබාගන්නා ලද ණය රුපියල් දශ ලක්ෂ 975 ක වැඩිවීමකිනුත් මහ බැංකුව

වෙතැති සංචිත රුපියල් දශ ලක්ෂ 674 ක අඩුවීමකිනුත්ය. කෙසේවෙතත්, වාණිජ බැංකු විසින් දරූ මහ බැංකු සුරැකුම්පත් රුපියල් දශ ලක්ෂ 1,015 ක වැඩිවීමකින් මෙම තත්ත්වය තරමක් දුරට සමහන් විය. මෙම වර්ෂය තුළදී වාණිජ බැංකු සම්පත් වර්ධනය කෙරෙහි රාජ්‍ය අංශයේ ශුද්ධ දයක වීම් රුපියල් දශ ලක්ෂ 297 ක් වූ අතර, විදේශීය අංශය වෙතින් වූ දායකත්වය රුපියල් දශ ලක්ෂ 175 ක් වූ සුළු ප්‍රමාණයක් විය.

### 1.46 සංඛ්‍යා සටහන

### වාණිජ බැංකු සම්පත්හි වෙනස්වීම සහ ඒවායේ උපයෝගීකරණය

| අංශය | 1984/1985 අවසානයට | 1985/1986 අවසානයට |
|---|---|---|
| 1. රජය .. .. | 944·8 | 297·4 |
| 2. මහ බැංකුව .. .. | – 2,350·7 | 634·0 |
| 3. රාජ්‍ය සංස්ථා .. .. | – 100·5 | – 1,670·0 |
| 4. සමූපකාර ආයතන .. .. | 420·5 | 21·5 |
| 5. අනෙකුත් පෞද්ගලික .. .. | 66·0 | – 163·5 |
| 6. අන්තර් බැංකු .. .. | – 489·4 | – 705·4 |
| 7. විදේශීය .. .. | 530·5 | 175·2 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

සටහන : අඩු කිරීමේ සළකුණින් ශුද්ධ වශයෙන් සම්පත් උපයෝගීකරණය දක්වේ.

**බැංකු ව්‍යාප්තිය**

1986 දෙසැම්බර් 31 වැනි දින සිට බැන්ක් ඔෆ් ඇමෙරිකා ශ්‍රී ලංකාවේ පවත්වා ගෙනගිය තම බැංකු සේවාවන් සහ කටයුතු අත්හිටුවන ලදී. ඒ අතරම, 1986 දෙසැම්බර් මාසයේදී ඩුබායි බැන්ක් ලිමිටඩ් බැංකුවට අයත් ව්‍යාපාර කටයුතු යූනියන් බැන්ක් ඔෆ්දී මිඩ්ල් ඊස්ට් ලිමිටඩ් බැංකුව විසින් පවරා ගනු ලැබුණි. මෙය 1985 අප්‍රේල් මාසයේදී යූනියන් බැන්ක් ඔෆ් ද මිඩ්ල් ඊස්ට් ලිමිටඩ් බැංකුව මගින් ඩුබායි බැන්ක් ලිමිටඩ් බැංකුවට අයත් සියළුම කොටස් මිළදී ගැනීමකට අනුකූලව සිදු වූවකි. අනතුරුව සියළුම රටවල පවත්වාගෙන යනු ලබන මෙම බැංකු දෙකේ ව්‍යාපාර කටයුතු යූනියන් බැන්ක් ඔෆ් ද මිඩ්ල් ඊස්ට් ලිමිටඩ් යටතේ ඒකාබද්ධ කිරීමට තීරණය කරන ලදී. මෙම වෙනස්වීම්වල ප්‍රතිඵලයක් වශයෙන් වර්ෂය අවසානයේදී ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වූ මුළු වාණිජ බැංකු සංඛ්‍යාව 25 සිට 23 දක්වා අඩු විය.

වාණිජ බැංකු ශාඛා ව්‍යාප්තිය 1986 දී තවදුරටත් අඩු විය. වර්ෂය තුළදී මුළු වාණිජ බැංකු ශාඛා සංඛ්‍යාව, ප්‍රතිස්ථානගත කරන ලද ගොවිජන සේවා මධ්‍යස්ථානයන්ද ඇතුළුව ශාඛා 3 කින් පමණක් වැඩි විය. 1985 වසරේ මෙම වැඩි වීම 11 ක් විය. ඒ අනුව වාණිජ බැංකු ශාඛාවන්හි මුළු සංඛ්‍යාව 1986 වසර අවසානයේදී 1,036 ක් විය.

වර්ෂය තුළදී ලංකා බැංකුව ප්‍රධාන ශාඛා 3 ක් විවෘත කරන ලදී. ගොවිජන සේවා මධ්‍යස්ථාන ශාඛාවක් ප්‍රතිස්ථානගත කිරීමත්, නගරබද ශාඛා දෙකක් ඒකාබද්ධ කිරීමත් සහ ව්‍යාප්ති කාර්යාලයක් වසා දැමීමත් මේ කාලය තුළදී සිදු විය. වර්ෂය අවසානයට ලංකා බැංකුවේ ශාඛාවන් 670 ක් ක්‍රියාත්මක වූ අතර, එයින් 238 ක් ප්‍රධාන ශාඛාවන් විය. 1985 අවසානයේදී මෙම ශාඛා ගණන පිළිවෙලින් 669 ක් සහ 236 ක් විය. වර්ෂය තුළදී මහජන බැංකුව සහ

සීමාසහිත ලංකා වාණිජ බැංකුව පිළිවෙලින් ශාඛා 4 ක් හා 1 ක් විවෘත කෙරුණි. මෙම බැංකු දෙකෙහි මුළු ශාඛා සංඛ්‍යාව 1986 වසර අවසානයේදී පිළිවෙලින් 297 ක් සහ 15 ක් විය. මේ අතර ඉන්දියානු රාජ්‍ය බැංකුව විසින් අනුරාධපුරයේ පිහිටුවා තිබූ එහි ශාඛාව 1986 ජූලි මාසයේදී වසාදමනු ලැබුණි.

1986 වසර තුළදී ජාතික ඉතිරි කිරීමේ බැංකුව නව ශාඛා 3 ක් විවෘත කරන ලද අතර, වසර අවසානයේදී එහි මුළු ශාඛා සංඛ්‍යාව 60 ක් විය. වර්ෂය තුළදී නව ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවක් හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ විවෘත කළ අතර, ඒ අනුව මුළු ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ගණන 5 ක් විය. මෙම ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු මගින් වසර තුළ ස්වකීය ක්‍රියාකාරී ප්‍රදේශයන් තුළ නව ශාඛාවන් 15 ක් විවෘත කරනු ලැබුණි. ඒ අනුව, 1986 වසර අවසානය වනවිට පැවති මුළු ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ශාඛා සංඛ්‍යාව 32 ක් බවට පත් විය.

### පොළී අනුපාතිකයන්


පොළී අනුපාතික ව්‍යුහයෙහි දක්නට ලැබුන පහත වැටීමේ ප්‍රවණතාවට අනුකූලව යමින් ජාතික ඉතිරි කිරීමේ බැංකුව සහ වාණිජ බැංකු ස්වකීය තැන්පතු අනුපාතිකයන් තවදුරටත් අඩු කරනු ලැබුණි. මේය මූල්‍ය සමාගම්වලටද ඒවායේ තැන්පතු අනුපාතිකයන් පහත හෙළීමට බලපානු ලැබීය. වාණිජ බැංකු අරමුදල්වල තැන්පතු සහතික අඩු කිරීම පිරිවැය පහත වැටීමට තුඩුදුන් අතර, එය ඔවුනට ස්වකීය ණය දීමේ අනුපාතිකයද තරමක් දුරට අඩුකර ලීමට උපකාරී විය.

ජාතික ඉතිරි කිරීමේ බැංකුව 1986 පෙබරවාරි මස සිට බලපැවැත්වෙන පරිදි එක් අවුරුදු තැන්පතු සම්බන්ධයෙන් වූ පොළී අනුපාතිකයන් වාර්ෂිකව සියයට 15 සිට සියයට 13 දක්වා අඩු කළ අතර, මාස හයකට අදළ තැන්පතු අනුපාතිකයන් වාර්ෂිකව සියයට 13 සිට සියයට 12 දක්වා අඩු කරන ලදී. කෙසේ වුවද, ඉතිරි කිරීමේ තැන්පතු සහ ඉතිරි කිරීමේ සහතිකපත් සම්බන්ධයෙන් වූ පොළී අනුපාතික පිළිවෙලින් වාර්ෂිකව සියයට 12 ක් සහ සියයට 11 ක්ව තවදුරටත් නොවෙනස්ව පැවතුණි. වාණිජ බැංකුද ඒවායේ එක් අවුරුදු තැන්පතුවලට අදළ පොළී අනුපාතිකය වසර තුළ අවස්ථා කිහිපයකදී අඩු කරන ලදී. මෙම වෙනස්වීම් සමගම 1985 වසර අවසානයට වර්ෂයකට සියයට 12–18 අතර පරතරයක් පැවති මාස දෙළහක තැන්පතු සඳහා වූ පොළී අනුපාතිකය 1986 වසර අවසානයේදී වාර්ෂිකව සියයට 8.5–14 පරතරයක් දක්වා අඩු විය. මේ අතර, මාස 6 ක් සඳහා වූ තැන්පතුවලට අදළ පොළී අනුපාතිකය වර්ෂයකට සියයට 9–19 අතර පරතරයක සිට වර්ෂයකට සියයට 8.5–13 ක පරතරයක් දක්වා 1986 වසර තුළදී පහත වැටුණි. මෙම කාලය තුළදී මාස 3 ක තැන්පතු සඳහා වූ පොළී අනුපාතිකය වර්ෂයකට සියයට 9–17 ක පරතරයක සිට වර්ෂයකට සියයට 8–12 ක් වූ පරතරයක් දක්වා අඩු කරනු ලැබීය. මෙම පහත වැටීම් අනුගමනය කරමින් මූල්‍ය සමාගම් විසින් ඒවායේ එක් අවුරුදු තැන්පතු සම්බන්ධයෙන් වූ පොළී අනුපාතික මෙම වසර තුළදී වාර්ෂිකව සියයට 18–22 අතර පරතරයක සිට වාර්ෂිකව සියයට 16–21 ක පරතරයක් දක්වා අඩු කරන ලදී. එමෙන්ම, මාස 3 සහ මාස 6 ක් සම්බන්ධයෙන් වූ පොළී අනුපාතිකද පහත හෙළනු ලැබීය.

මහ බැංකුවේ අපනයන ණය ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රම දෙක යටතේ එනම් අනු කොටස් I සහ II සඳහා වූ ප්‍රතිමූල්‍ය අනුපාතිකයන් 1985 දෙසැම්බර් 30 දින සිට බලපාන පරිදි ප්‍රතිශත අංක 2 කින් අඩු කරනු ලැබුණි. මේ නිසා වාණිජ බැංකුවලට 1986 දී අපනයන ණය දීමේදී බලපාන අනුපාතික අඩු කිරීමට හැකි විය. මෙයට අමතරව, තැන්පතු සඳහා වන පොළී අනුපාතික පහත හෙළීම සහ ශ්‍රේණි මත වැඩි වූ තැන්පතු සඳහා නියම කරන ලද සංචිත ඉවත් කර ගැනීමත් හේතුවෙන් වාණිජ බැංකුවල අරමුදල් පිරිවැය අඩු වීම හේතුකොට ගෙන ප්‍රමුඛතා අංශවලට දෙන ණය අනුපාතික අඩු කිරීමට බැංකුවලට හැකි විය.

# පොලී අනුපාතික

**කාර්තු අවසානයට පැවති සංඛ්‍යා**



වසර තුළදී කෙටිකාලීන මූල්‍ය වෙළෙඳපොල පොළී අනුපාතිකයන්ගේද අඩු වීම් දක්නට ලැබුණි. ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් සම්බන්ධයෙන් වූ පොළී අනුපාතිකයද 1986 ජනවාරි මාසයේදී වාර්ෂිකව සියයට 11.5 සිට සියයට 11 දක්වා අඩු විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ද්විතීය භාණ්ඩාගාර බිල්පත්වල විකිණීමේ සහ මිළදී ගැනීමේ පොළී අනුපාතිකයන්ද පිළිවෙලින් වාර්ෂිකව සියයට 11.3 සහ සියයට 11.5 සිට වාර්ෂිකව සියයට 10.8 සහ සියයට 11.0 දක්වා පිළිවෙලින් අඩු විය. 1986 නොවැම්බර් මාසය තුළදී මෙම අනුපාතිකයන් පිළිවෙලින් වසරකට සියයට 11 ක් සහ සියයට 10 ක් දක්වා තවදුරටත් අඩු විය. මහ බැංකු සුරැකුම්පත් සම්බන්ධයෙන් ගණුදෙනු කරුවනට දෙනු ලබන පොළී අනුපාතිකය මෙම වසරේ ජනවාරි මාසයේදී වර්ෂයකට සියයට 14 සිට සියයට 12 දක්වා පහත වැටුණි. මේ අතර, තැන්පතු සහතිකපත් සම්බන්ධයෙන් වාණිජ බැංකු විසින් දෙනු ලබන පොළී අනුපාතිකයන් වර්ෂයකට සියයට 8 සහ සියයට 17 ක පරතරයක සිට වර්ෂයකට සියයට 6 ත් සියයට 15 ත් දක්වා පරතරයකට අඩු කරන ලදී. බොහෝ බැංකුවල පැවති අධි ද්‍රවශීලතා තත්ත්වය පිළිබිඹු කරමින් අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳපොලේ උපරිම පොළී අනුපාතිකය 1985 වසර අවසානයට පැවති වර්ෂයකට සියයට 14 ක සිට 1986 වසර අවසානයේදී වර්ෂයකට සියයට 12.75 දක්වා අඩු විය.

කෙටිකාලීන පොළී අනුපාතිකයන්ගේ පහත වැටීම අනුගමනය කරමින් දිගුකාලීන පොළී අනුපාතිකයන්ද පහත වැටුණි. මේ අනුව 1986 ජනවාරි මස සිට බලපැවැත්වෙන පරිදි මහ බැංකුව විසින් මැදි හා දිගුකාලීන ණය අරමුදලේ II, III සහ IV අනු කොටස් යටතේ වන ප්‍රතිමූල්‍ය ණය සැපයීමේ අනුපාතිකද ප්‍රතිශත අංක දෙකකින් අඩු කරන ලදී. ජනවාරි මාසය තුළදීම රජයේ සුරැකුම්පත් සම්බන්ධයෙන් වූ පොළී අනුපාතිකය වාර්ෂිකව සියයට 14 සිට සියයට 12 දක්වා අඩු කරන ලද අතර, කල් පිරීමේ කාලය වසර 6 ක් ලෙස නොවෙනස්ව පැවතුණි. මේ අතර රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවද සියළුම ණය ශීර්ෂ සම්බන්ධයෙන් අය කරන පොළී අනුපාතිකද ප්‍රතිශත අංක 2 කින් අඩු කළේය. මේ අතර ලංකා සංවර්ධන මූල්‍ය සමායතනයද ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රම වලින් බැහැරව දෙනු ලබන අත්තිකාරම් සම්බන්ධයෙන් අය කරන පොළී අනුපාතික වර්ෂයකට සියයට 14 සහ 21 ක පරතරයක සිට සියයට 14 සහ 18 ක පරතරයක් දක්වා අඩු කළේය. ජාතික ඉතිරි කිරීමේ බැංකුවද වසර තුළදී ණය දෙන අනුපාතිකයන් වර්ෂයකට සියයට 12 සහ 21 ක පරතරයක සිට සියයට 12 සහ 20 ක පරතරයක් දක්වා අඩු කරන ලදී.

ණය දීමේදී බැංකු අතර පවත්නා තරඟකාරීභාවය ඉහළ නැංවීමේ අදහසින් මහ බැංකුව විසින් බර තැබූ පදනමක් මත වාණිජ බැංකුවල සාමාන්‍ය ප්‍රමුඛ ණය දීමේ අනුපාතිකය සතිපතා පළ කිරීම ඇරඹීය. ප්‍රමුඛ ණය දෙන අනුපාතිකය හැටියට සළකන්නේ වාණිජ බැංකු විසින් ඒවායේ ප්‍රමුඛ ගණුදෙනු කරුවන්ගෙන් අය කරන අඩුම පොළී අනුපාතිකය වේ. 1986 වසර තුළදී ප්‍රමුඛ සාමාන්‍ය ණය දෙන අනුපාතිකය වර්ෂයකට සියයට 14 සිට සියයට 15.6 අතර පරතරයක උච්චාවචනය විය.

**මහ බැංකු කටයුතු**

1986 අවසානයේදී මහ බැංකුවේ මුළු වත්කම්/වගකීම් රුපියල් දශ ලක්ෂ 43,164 ක් වූ අතර එය වසර තුළදී රුපියල් දශ ලක්ෂ 2,005 (සියයට 5 ) කින්වූ වැඩි වීමකි. පසුගිය වසර තුළදී වත්කම්/වගකීම්හි රුපියල් දශ ලක්ෂ 7,887 (සියයට 24 ) ක තියුණු වැඩි වීමක් දක්නට ලැබුණි.

වත්කම් අංශයෙහි ලා මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතය (දළ) දෙවෙනි වසරටත් අඩු විය. 1986 වසර තුළදී දක්නට ලැබුන අඩු වීම රුපියල් දශ ලක්ෂ 1,890 ක් හෙවත් සියයට 16 ක් විය. 1986 දී විදේශයන්හි පැවති මුදල් හා ශේෂ රුපියල් දශ ලක්ෂ 3,599 කින් අඩු වීමකුත් විදේශීය සුරැකුම්පත් හා භාණ්ඩාගාර බිල්පත්හි කරන ලද ආයෝජනයන් රුපියල් දශ ලක්ෂ 1,710 කින් වැඩි වීමකුත් විය.

අනෙකුත් වත්කම් හා ගිණුම් හැර මහ බැංකුවේ දේශීය වත්කම් 1986 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 3,111 (සියයට 12) කින් වැඩි විය. මෙම වැඩිවීම දේශීය වත්කම් යටතේ දක්වා ඇති සියළුම ප්‍රධාන ශීර්ෂවල පිළිබිඹු විය. මෙම වැඩි වීමෙන්, ඍජු අත්තිකාරම් ආකාරයෙන් රජයට දෙන ලද ණය සහ රජයේ හා රජය සහතික කළ සුරැකුම්පත් ආකාරයෙන් වූ ආයෝජන රුපියල් දශ ලක්ෂ 2,085 ක් වූ අතර, වාණිජ බැංකුවලට සහ අනෙකුත් මූල්‍ය ආයතනවලට දෙන ලද අත්තිකාරම් රුපියල් දශ ලක්ෂ 1,025 ක් විය.

මෙම වසර තුළදී වාණිජ බැංකුවලට දෙන ලද අත්තිකාරම් රුපියල් දශ ලක්ෂ 1,016 කින් ඉහළ ගියේය. මෙය, ප්‍රධාන වශයෙන් කෙටිකාලීන ප්‍රතිමූල්‍ය ණයෙහි වැඩි වීම හේතුකොට ගෙන සිදුවූවකි. ප්‍රධාන වශයෙන්ම ඉදිරි විදේශීය විනිමය ගණුදෙනුවල රුපියල් දශ ලක්ෂ 590 ක ප්‍රසාරණයක් හේතුකොටගෙන මහ බැංකුවේ අනෙකුත් වත්කම් හා ගිණුම් රුපියල් දශ ලක්ෂ 785 කින් වර්ධනය විය.

වගකීම් අංශයෙහි ලා 1986 වසරේදී මහ බැංකුවේ මූල්‍ය වගකීම් (සංසරණයෙහි පවත්නා ව්‍යවහාර මුදල් සහ තැන්පතු) රුපියල් දශ ලක්ෂ 1,445 කින් අඩු විය. මෙම අඩු වීම තැන්පතු රුපියල් දශ ලක්ෂ 2,989 කින් හෙවත් සියයට 23 කින් පහත වැටීමේත් සංසරණය වූ ව්‍යවහාර මුදල් රුපියල් දශ ලක්ෂ 1,544 කින් හෙවත් සියයට 14 කින් ඉහළ යාමේත් ඒකාබද්ධ ප්‍රතිඵලය විය. ජාත්‍යන්තර සංවිධාන, විදේශීය ආණ්ඩු සහ විදේශීය බැංකු ආයතන සතු තැන්පතු තවදුරටත් රුපියල් දශ ලක්ෂ 1,646 කින් අඩු විය. මේ අතර, වාණිජ බැංකු සහ රජය සතු තැන්පතු පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 445 කින් සහ රුපියල් දශ ලක්ෂ 409 කින් අඩු වුණි. මහ බැංකුවේ අනෙකුත් තැන්පතුද රුපියල් දශ ලක්ෂ 526 කින් අඩු විය. අනෙක් අතට, රාජ්‍ය නියෝජ්‍යත්ව සහ ආයතන සතු තැන්පතු ද මෙම වසර තුළදී රුපියල් දශ ලක්ෂ 37 කින් වැඩි වුණි.

මෙම වසර තුළදී, ආර්ථිකයේ පවත්නා අධි ද්‍රවශීලතා තත්ත්වය ඇද ගැනීමේ අදහසින් මහ බැංකුව විසින් ස්වකීය සුරැකුම්පත් නිකුත් කිරීම තවදුරටත් සිදු කරන ලදී. වසර තුළදී නිකුත් කරන ලද මහ බැංකු සුරැකුම්පත්වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 4,079 ක් වූ අතර, වසර අවසානයට නොපියවා පැවති ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2,604 ක් විය. මේ හා සසඳන විට, 1985 වසර අවසානයට නොපියවා පැවති ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,168 ක් විය. මහ බැංකුවේ අනෙකුත් වගකීම් හා ගිණුම් රුපියල් දශ ලක්ෂ 1,750 කින් වැඩි වීමට ප්‍රධාන හේතු වූයේ ජාත්‍යන්තර සංචිත ප්‍රති වටිනාකම් ගිණුමේ සහ ඉදිරි විදේශීය විනිමය ගණුදෙනු සම්බන්ධව පවත්නා වගකීම්හි ඇති වූ වැඩි වීමය.

**මූල්‍ය ප්‍රතිපත්තිය**

1986 දී මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්තිය ආර්ථිකයේ ඵලදායී අංශයන්හි ක්‍රියාකාරිත්වය නංවාලීමේ අදහසින්, 1984 සිට පවත්වාගෙන ආ සීමාකාරී පුළුල් මූල්‍ය ප්‍රතිපත්තිමය රාමුව තුළ මෙහෙයවනු ලැබීය. ආර්ථිකයෙහි ඉහළ ගිය ද්‍රවශීලතාවය ඇද ගැනීම සඳහා මහ බැංකුව විසින් ස්වකීය සුරැකුම්පත් නිකුත් කිරීම තවදුරටත් සිදු කරන ලද අතර, මූල්‍ය ප්‍රතිපත්තියට වඩාත් වැඩි වෙළෙඳපොල අනුකූලතාවක් ඇති වන පරිදි 1984 මුල් කාලයේදී පනවනු ලැබූ සමහර ප්‍රමාණාත්මක ණය පාලන සීමාවන් ලිහිල් කෙරුණි.

ආර්ථිකයේ ඵලදායී අංශවල කටයුතු නංවාලීමේ අදහසින් වසර තුළදී ප්‍රතිපත්ති පියවර කිහිපයක් හඳුන්වා දෙන ලදී. 1986 පෙබරවාරි මාසයේදී කර්මාන්ත අරමුණු සඳහා පෞද්ගලික අංශයට දෙන ලද වාණිජ බැංකු ණය, 1984 මැයි මාසයේ සිට පැවති ණය පාලන සීමාවන්ගෙන් ඉවත් කරන ලදී. මෙම සීමාවන් හඳුන්වා දෙනු ලැබූ අවස්ථාවේදී කෘෂිකර්ම සහ අපනයන කටයුතු සඳහා දෙන වාණිජ බැංකු ණය එකී ණය පාලන සීමාවන්ගෙන් ඉවත් කරන ලදුව ඒවා තවදුරටත් එලෙසම පැවතිණි. ප්‍රමුඛතා අංශවලට ණය දීමේදී ඇති වන පොළී පිරිවැය අඩු

කරලීමේ අදහසින් මහ බැංකුවේ මැදි හා දිගුකාලීන ණය අරමුදල යටතේ II, III සහ IV යන අනු කොටස්වලට අදාළව බලපවත්වන ප්‍රතිමූල්‍ය පොළී අනුපාතිකයන් 1986 ජනවාරි මාසයේදී ප්‍රතිශත අංක දෙකකින් අඩු කරන ලදී. මීට අමතරව ජුනි මාසයේදී, තමනට පාලනය කළ නොහැකි කිසියම් හේතූන් මත දින 90 ක කාලසීමාව තුළ භාණ්ඩ නැව්ගත කිරීමට කිසියම් අපනයනකරුවකු අපොහොසත් වුවහොත් සම්ප්‍රදායික අපනයන (අනු කොටස් I) සහ සම්ප්‍රදායික නොවන (අනු කොටස් II) අපනයන සඳහා දෙන ප්‍රතිමූල්‍ය ණය සම්බන්ධව අදාළ කාලච්ඡේදය දින 90 සිට දින 120 දක්වා දීර්ඝ කරන ලදී.

මේ සමගම, සම්ප්‍රදායික හා සම්ප්‍රදායික නොවන අපනයන සම්බන්ධයෙන් වූ ප්‍රතිමූල්‍ය අනුපාතික පිළිවෙලින් සියයට 11 සහ සියයට 6 දක්වා ප්‍රතිශත අංක දෙකකින් පහත හෙලනු ලැබීය. සියයට 4 ක් වූ පොළී ප්‍රතිදානයද වාණිජ බැංකු ස්වකීය ගණුදෙනුකරුවන්ට ප්‍රතිමූල්‍ය ණය දීමේදී බලපවත්නා ආන්තිකයන්ද සැළකිල්ලට ගත්විට, අනු කොටස් I සහ II යටතේ ණය ගැනීමේදී ගණුදෙනුකරුවන් විසින් ඇත්තෙන්ම දැරිය යුතු පිරිවැය පිළිවෙලින් වර්ෂයකට සියයට 10 සහ සියයට 5.8 දක්වා මේ අනුව පහත වැටුණි. සම්ප්‍රදායික අපනයන සඳහා කිසියම් අවස්ථාවකදී පවත්නා මුළු ප්‍රතිමූල්‍ය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,500 සිට රුපියල් දශ ලක්ෂ 1,663 ක් දක්වා ඉහළ නංවන ලදී. 1986 දෙසැම්බර් මාසයේදී එළදායී අංශ තුළ සිදු කෙරෙන ආයෝජන තවදුරටත් නංවාලීමේ අරමුණින් මහ බැංකුව විසින් ස්වකීය පොදු සංචිතයන්ගෙන් මැදි හා දිගු කාලීන ණය අරමුදලට රුපියල් දශ ලක්ෂ 250 ක සංක්‍රාමයක් කරන ලදී. ඒ අනුව, මෙම අරමුදලේ ප්‍රතිමූල්‍ය ණය දීමේ හැකියාව රුපියල් දශ ලක්ෂ 1,025 ක් දක්වා වැඩි කෙරුණි.

1985 වසර පුරාම දක්නට ලැබුන වෙළෙඳපොල පොළී අනුපාතිකයන්ගේ අඩු වීමේ උපනතිය අනුව යමින් වාර්ෂිකව සියයට 11.5 ක්ව තිබූ ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොල පොළී අනුපාතිකය 1986 ජනවාරි මාසයේදී වර්ෂයකට සියයට 11.0 දක්වා අඩු විය. එමෙන්ම වාණිජ බැංකු ඒවායේ ණය දෙන අනුපාතික අඩු කරලීම කෙරෙහි තවදුරටත් යොමු කරනු වස්, 1984 නොවැම්බර් මාසයේ සිට ක්‍රියාත්මක වූ ශ්‍රේණිගත වැඩිවූ තැන්පතු සඳහා මහ බැංකුව සමග පවත්වා ගතයුතුව පැවති විශේෂ සංචිත පිළිබඳ අවශ්‍යතාවයද 1986 පෙබරවාරි මාසයේදී ඉවත් කර ගන්නා ලදී. ඒ අනුව ණය දීම සඳහා භාවිතා කළ හැකි රුපියල් දශ ලක්ෂ 721 ක ප්‍රමාණයක් වාණිජ බැංකුවලට පෙරලා ලැබීම හේතුවෙන් වාණිජ බැංකුවල අරමුදල් පිරිවැය පහත වැටීමට උපකාරී විය. මෙකී පියවරයන්ට ප්‍රතිචාරයක් වශයෙන් ආරම්භයේදී වාණිජ බැංකු ඒවායේ තැන්පතු අනුපාතික අඩු කරන ලද අතර, ඉන් පසුව ප්‍රමුඛතා අංශවලට දෙනු ලබන අත්තිකාරම් හා සම්බන්ධ ඒවායේ ණය දෙන අනුපාතිකයන්ද අඩු කරනු ලැබීය.

මේ අතර අධි ද්‍රවශීලතාවය ඇද ගැනීමේ අදහසින් මහ බැංකුව ස්වකීය සුරැකුම්පත් නිකුත් කිරීම නොකඩවා සිදු කරන ලද අතර, එමගින් සංචිත මූල්‍ය පදනම අඩුකරලීමටද හැකි විය. 1985 වසර අවසානයෙහි රුපියල් දශ ලක්ෂ 1,168 ක මට්ටමේ නොපියවා පැවැති එකී සුරැකුම්පත් 1986 වසර අවසානය වනවිට රුපියල් දශ ලක්ෂ 2,604 ක මට්ටමක් දක්වා ඉහළ නැගුණි.

සීමාකාරී පුළුල් මූල්‍ය ප්‍රතිපත්ති රාමුවක් තුළ ප්‍රමුඛතා අංශවලට අවශ්‍ය ණය ගලා යාම දිරි ගැන්වීමේ අවශ්‍යතාව පදනම් කරගෙන සකසන ලද ජාතික ණය සැලැස්මට අනුව, මහ බැංකුව විසින් 1986 ණය පිළිබඳව වූ වර්ධනයන් විමසා බලනු ලැබීය. ජාතික ණය සැලැස්ම අනුව පෞද්ගලික අංශයට (එනම් සංස්ථා, සමුපකාර සහ පෞද්ගලික අංශය) දෙන ලද නොපියවා පැවති ණය, 1986 වර්ෂය අවසානයට රුපියල් දශ ලක්ෂ 43,659 මට්ටමකට ලඟා වෙතැයි ඇස්තමේන්තු කරන ලදී. මෙය රුපියල් දශ ලක්ෂ 4,852 හෙවත් සියයට 12 ක ප්‍රසාරණයකි. 1985 දී දක්නට ලැබුනේ රුපියල් දශ ලක්ෂ 3,435 ක හෙවත් සියයට 10 ක වැඩි වීමකි. ආංශික වශයෙන් ණය වෙන් කිරීමේදී කෘෂිකර්ම, අපනයන සහ කර්මාන්ත යන අංශ ප්‍රමුඛතා අංශ ලෙස තවදුරටත් සළකනු ලැබුණි.

1986 වසරේදී ණය සම්බන්ධව දක්නට ලැබුන කැපී පෙනෙන ලක්ෂණය වූයේ ණය සැලැස්මේ දක්වුනු ඇස්තමේන්තු හා සැසඳීමේදී ණය උපයෝගීතාවය අඩු මට්ටමක පැවතීමයි. වසර පුරාම වාගේ ණය ගලායාම අඩු මට්ටමක පැවති අතර, වසර අවසානයට නොපියවා පැවති ණය, සැලැස්මේ ඇස්තමේන්තුවලට වඩා එය රුපියල් දශ ලක්ෂ 2,629 කින් හෙවත් සියයට 6 කින් අඩු විය. ප්‍රමුඛතා අංශ මගින් සිදු කරනු ලැබූ ණය උපයෝගීකරණය අඩුවීම සම්බන්ධයෙන් බලපාන හේතූන් කිහිපයක්ම විය. පළමුව, සම්ප්‍රදායික අපනයන මිළ ගණන්වල අඩුවීම හේතුවෙන් නාමික වශයෙන් අපනයන ණය සඳහා වූ ඉල්ලුම අඩු විය. විශේෂයෙන්ම, එය පෙර නැව්ගත කිරීමේ ණය සම්බන්ධයෙන්ද දක්නට ලැබුණි. දෙවනුව, රජයට අයත් වතු අංශය සඳහා පිළියෙල කරනු ලැබූ මැදි කාලීන ආයෝජන වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේදී ඇතිවූ ප්‍රමාදයයි. තෙවනුව, මෙම වසර තුළ සමහර දිස්ත්‍රික්කයන්හි අත්දුටු අයහපත් කාලගුණ තත්ත්වය ද කෘෂිකාර්මික අංශය වෙතින් ඇතිවූ ණය ඉල්ලුම තවදුරටත් හීන කරලී ය.

1986 දී ප්‍රථම වතාවට ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු හතරක (එනම් කළුතර, කුරුණෑගල, මාතර සහ අනුරාධපුර) ණය දීමේ කටයුතුද, දිගු කාලීන ණය සපයන ආයතන හතරක් වන ලංකා සංවර්ධන මූල්‍ය සමායතනය, ජාතික සංවර්ධන බැංකුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව යන ආයතනවල ණය දීමේ කටයුතුද ඇතුළත් කිරීම සඳහා ජාතික ණය සැලැස්මේ ක්ෂේත්‍රය පුළුල් කරනු ලැබීය. මෙම ආයතනවල ණය ගලා යාම සාමාන්‍යයෙන් ආර්ථිකයේ දුර්වල සහ ප්‍රමුඛතා අංශ කෙරෙහි යොමු විය.

ලක්ෂ්‍යමය පදනමක් යටතේ, කොළඹ පාරිභෝගික මිළ දර්ශකයේ වාර්ෂික වර්ධන අනුපාතිකය 1985 අවසානයට පැවති සියයට 1.5 සිට 1986 අවසානයේදී සියයට 9 දක්වා වැඩි විය. මේ අතර, මෙම දර්ශකයට අදල වාර්ෂික සාමාන්‍ය වර්ධන අනුපාතිකය, 1985 දී සියයට 1.5 සිට 1986 දී සියයට 8 දක්වා ඉහළ නැගුණි. අයහපත් කාලගුණ තත්ත්වය හේතුකොටගෙන දේශීය වශයෙන් නිෂ්පාදිත ආහාර භෝග සැපයුම අඩාලවීමත්, සමහර ප්‍රදේශවල පැවති සිවිල් කලබලත් වසර තුළ මිළ ගණන් වැඩි වීමට විශාල වශයෙන් හේතු විය. මීට අමතරව, 1985 වසරේ අග සිට කොළඹ පාරිභෝගික මිළ දර්ශකයෙහි රෙදිපිළි උපදර්ශකය සැළකිය යුතු අන්දමින් ඉහළ නැගීමද අරක්කු සහ බීර සඳහා අදල සුරා බදු සහ දුම්කොළ බද්ද ඉහළ යාමද 1986 මිළ ගණන්හි වැඩිවීම සඳහා දයක විය. ඉල්ලුම් අංශයෙන් සළකන කල, අධි ද්‍රවශීලතාවය ඇද ගැනීම සඳහා විවට වෙළෙඳපොල කටයුතු වැනි මූල්‍ය ප්‍රතිපත්ති පියවර-යන් පවත්වා ගෙන යාමත් ප්‍රමුඛ නොවන අංශවලට දෙන ණය පරිමාව සම්බන්ධයෙන් පැනවූ සීමාවන් දිගටම බලපැවැත්වීමත් මූල්‍ය හා ණය සමස්තයන්ගේ වර්ධනය සීමා කිරීමට උපකාරී වූ අතර, එමගින් මිළ ගණන් කෙරෙහි බලපවත්නා පීඩනයද ලිහිල් කෙරුණි.